**ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 මාර්තු 07 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,349.12 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,132.30 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 216.82 ක් හෙවත් සියයට 9.23 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,999.12 | 1,941.63 | 57.49 | 2.88 |
| මූලධන | 350.00 | 190.67 | 159.33 | 45.52 |
| **එකතුව** | **2,349.12** | **2,132.30** | **216.82** | **9.23** |

**2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 55.00 | 42.93 | 50.0 | 52.56 | 200.00 | 101.42 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වූ තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 34.00 ක ශේෂයක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0081/000 | 0.60 |
| 6000/0000/00/0016/0058/000 | 24.50 |
| 6000/0000/00/0018/0070/000 | 8.90 |
| **එකතුව** | **34.00** |

**2.4 විගණන නිරීක්ෂණය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | පවත්වා නොතිබුණි. |
| (iii) | ගාස්තු ලේඛන(මුදල් ලැබීම් සඳහා ලේඛන) | මුදල් රෙගුලාසි 165(4) | පවත්වා නොතිබුණි |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |

**3.2 අයවැය විචලනය**

වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 94 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ඉක්මවූ රු.මිලියන 2.52 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 21501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 101.42 ක් විය. ඉන් ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගිය හා මිය ගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය, නිලධාරීන්ගේ ණය ශේෂය රු.මිලියන 4.12 ක් වූ අතර එය වර්ෂ 1 සිට වර්ෂ 20 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් පරිදි ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව වත්කම් නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(i) වසර 10 ක පමණ කාලයක සිට හෝමාගම කාර්මික විද්‍යාලයේ වාහන ඉසිලීමේ (vehicle hoist) යන්ත්‍රයක්

(ii) මහනුවර තාක්ෂණ විද්‍යාලය වෙත 2010 වර්ෂයේදී ව්‍යාපෘතියක් මගින් ලබා දී තිබූ CNC Milling යන්ත්‍රය හා CNC Lathe යන්ත්‍රය.

(iii) බදුල්ල කාර්මික විද්‍යාලයේ ඇති CNC Lathe යන්ත්‍රය.

(iv) අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව දඹුල්ල කාර්මික විද්‍යාලයේ වසා දමා ඇති වායු හා වාෂ්ප පැස්සුම්, යාන්ත්‍රික ලී වැඩ, පෙදරේරු යන කර්මාන්තශාලාවල ඇති උපකරණ.

### 3.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.4. ඡේදයේ ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයන්ගෙන් හෙළිදරව් වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2017 අප්‍රේල් 15 දිනට අවසන් කළ යුතු වුවත් තාක්ෂණ/ කාර්මික විද්‍යාල 04 ක එම කටයුතු 2017 ඔක්තෝබර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

### 3.5.3 බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ඉඩම් බාහිර පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු අතර එම ඉඩම් මුදාහැරි දිනයන් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

| | ප්‍රමාණය | වත්කම් පිහිටි ස්ථානය | වත්කම් ලබා දී ඇති ආයතනය | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (i) | අක්කර 10 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය- වැවේතැන්න ඉඩම | විශ්වවිද්‍යාල | අවශ්‍ය මැනීම් කටයුතු හා පිඹුරු පත් සැකසීම සිදු කර නොතිබුණි. |
| (ii) | අක්කර 08 | - එම - | යොවුන් සේනාංකය | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |
| (iii) | පර්චස් 110 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ පිහිණුම් තටාකය | ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරියෙක් විසින් භාර ගෙන ඇතත් විධිමත් ලිපියක් කාර්මික විද්‍යාල වෙත ලබාදී නොතිබුණි. |
| (iv) | පර්චස් 9.5 | කැගල්ල කාර්මික විද්‍යාලය | බාහිර පුද්ගලයෙකු | 1997 වර්ෂයේදී වසර 30 කට බදු දී තිබුණද බදු ගිවිසුම දෙපාර්තමේන්තුවේ නොතිබුණි. |
| (v) | පර්චස් 6.8 | - එම - | බාහිර පුද්ගලයෙකු | බාහිර පුද්ගලයෙක් බලෙන් පදිංචි වී සිටින අතර ඒ සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 04 දින කැගල්ල කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ විරුද්ධත්වය දක්වා තිබුණද දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි. |
| (vi) | අක්කර 05 | - එම - | යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |
| (vii) | අක්කර 1.5 | - එම - | විවෘත විශ්ව විද්‍යාලය | නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි. |
| (viii) | රූඩ් 3 පර්.3.9 | රත්මලාන කාර්මික විද්‍යාලය | විශ්ව විද්‍යාල | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |

## 3.5.4 වාහන පාලනය

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 70 කින් යුත් වාහන ඇණිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බෙලිඅත්ත කාර්මික විද්‍යාලයට අනුයුක්ත කර තිබූ වාහනයක් 2011 මාර්තු 18 දින එන්ජිම අකර්මන්‍ය වීම හා 2011 ජූනි 05 දින එම විද්‍යාලයේ නවතා තිබියදී පසුපස වීදුරුව බිඳීයාම යන සිද්ධීන් දෙක හේතුවෙන් වාහනය යථා තත්වයට පත් කිරීම සඳහා රු.මිලියන 1.97 ක් වැයකර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර 2014 ජූනි 25 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව අලාභයෙන් සියයට 40 ක් රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය වී තිබුණද එම මුදල 2017 ඔක්තෝබර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ආ) අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ මෝටර් කෝච් වර්ගයේ වාහනයක් 2012 සැප්තැම්බර් 27 දින එහි අධ්‍යක්ෂවරයා විසින් පදවාගෙන යන අවස්ථාවේ අනතුරට ලක්වී තිබුණු අතර එම වර්ගයේ වාහන (මෝටර් කෝච්) පැදවීම සඳහා අදාල වූ රියදුරු බලපත්‍රයක්ද ඔහු විසින් ලබාගෙන නොතිබුණි. එම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 1.00 ක පමණ මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර 2013 ජනවාරි 11 දින සිදුකරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව වාහනය සඳහා රියදුරකු පත්කර නොතිබීම හා සර්වග්‍රාහී රක්ෂණයක් කර නොතිබීම හේතුවෙන් අලාභයෙන් සියයට 50 ක් වාහනය පැදවූ අධ්‍යක්ෂවරයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව එම අධ්‍යක්ෂවරයාගෙන් අයවියයුතු අලාභය රු.මිලියන 1.03 න් සියයට 50 ක ප්‍රමාණය 2017 ඔක්තෝබර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 26 දින රු.462,450 ක් වැය කර අලුත්වැඩියා කරන ලද වාහනයක එන්ජිම ඉන් මාස 3 කට පසු ක්‍රියාවිරහිත වී තිබුණි. එදින සිට විගණිත දිනය වූ 2017 ඔක්තෝබර් 31 දින වන විට වර්ෂ 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණද මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) කොරියානු ආධාර යටතේ 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු ජීප් රථයක් දෙපාර්තමේන්තුවේ කටයුතුවලට යොදා නොගෙන අදාල රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබුණි.

## 3.5.5 රජයේ නිවාස පාලනය

-------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව රජයේ නිවාස 260 ක් දෙපාර්තමේන්තුව සතුව පැවතුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව බදු කාලය ඉක්මවා පදිංචිව සිටින කාල පරිච්ඡේදය වෙනුවෙන් පොරොත්තු ලේඛනයේ ඉල්ලුම්කරුවන් සිටින අවස්ථාවලදී දන්ඩන කුලියක් අයකර ගත යුතුවේ. එසේ වුවත් අනුරාධපුර, නුවරඑළිය, දඹුල්ල,මහනුවර, දෙහිඅත්තකණ්ඩිය හා ගාල්ල යන විද්‍යාලවලට හිමි නිල නිවාසවල නිලධාරීන් 12 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

ඉහත සඳහන් නිලධාරීන් අතර දඹුල්ල හා මහනුවර කාර්මික විද්‍යාලවල වසර 10 ඉක්මවූ නිලධාරීන් 04 ක්ද වූ අතර පොරොත්තු ලේඛනයේ ඉල්ලුම්කරුවන් සිටින

අවස්ථාවලදීද දන්ඩන කුලිය ගෙවමින් වසර 10 ඉක්මවූ නිලධාරීන් 02 ක් රත්මලාන හා හෝමාගම කාර්මික විද්‍යාලවල පදිංචිවී සිටින බව නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව සතු නිවාස ගණන, පිහිටි ස්ථානය, නිවාස වර්ගය, පදිංචි වී සිටින නිලධාරීන්ගේ විස්තර හා ගෙවන කුලී පිළිබඳ විස්තර සඳහන් ලේඛනයක් හා පොරොත්තු ලේඛනයක් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් නිල නිවාස පාලනය දුර්වල තත්ත්වයක පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) නිවාස ලිපිගොනු පරීක්ෂාවේදී නිලධාරීන් විසින් නිරන්තරයෙන් නිවාස ඉල්ලුම් කරන බව නිරීක්ෂණය වූ අතර බඳු කාලය අවසන් වීමේදී, ස්ථාන මාරුවීමේදී, විශ්‍රාම යාමේදී නිවාස නියමිත දිනයන්හිදී භාර නොදීම හා ඒ පිළිබඳ ක්‍රියා මාර්ග නොගැනීම හේතුවෙන් නිවාස ඉල්ලුම් කරන නිලධාරීන් සම්බන්ධයෙන් සාධාරණ පරිදි කටයුතු කිරීමට නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව දෙපාර්තමේන්තුව සතු නිවාසවලින් 110 ක් අබලන් තත්ත්වයේ පැවතුණු අතර නිවාස 08 ක් පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. තවද එම නිවාස පිළිසකර කිරීම සඳහා දෙපාර්තමේන්තුව නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

**3.6 අනුකූල නොවීම**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIVපරිච්ඡේදයේ 2.1 හා 2.2 වගන්ති | ගමන් වියදම් ඉල්ලුම්පත්වල රාජකාරි ගමන ආරම්භ වන ස්ථානය නිගමනය කිරීමට අවශ්‍ය ස්ථිර ලිපිනය සඳහන් කර නොතිබූ අවස්ථා 23 ක් නිරීක්ෂණය විය. |
| (ii) XIV පරිච්ඡේදයේ 4.1 වගන්තිය | ගෙවිය යුතු සංයුක්ත දීමනාව තීරණය කිරීම සඳහා අදාල ගමනේ දුර ප්‍රමාණය වවුචරයේ සඳහන් කළ යුතු වුවත් එසේ කර නොමැති අවස්ථා 23 ක් නිරීක්ෂණය විය. |
| (iii) XIV පරිච්ඡේදයේ 28.5 හා 28.6.1 වගන්තිය | ➢ ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණ ගමන් වියදම් වවුචර සඳහා නියමිත පරිදි ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණු අවස්ථා 38 ක් නිරීක්ෂණය විය.<br>➢ ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණ ගමන් වියදම් වවුචරවලින් ප්‍රමාද ගාස්තු නිවැරදිව අයකර නොතිබුණු අවස්ථා 13 ක් නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (iv) XIV පරිච්ඡේදයේ 28.6.1 වගන්තිය | ගමන් වියදම් ඉල්ලුම්පත් මාස 03 කට වඩා වැඩි කාලයක් ඉකුත් වූ විට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා නොගත් අවස්ථා 17 ක් නිරීක්ෂණය විය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 138(6) | ගෙවීමක් කිරීමේදී ගෙවීමට අදාල ලිපිගොනු පිළිබඳ යොමු සටහන් වවුචරයේ සඳහන් කළ යුතු වුවත් එසේ කර නොතිබූ අවස්ථා 12 ක් නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 115(1), (2), (3)(ආ) | ඉකුත් වර්ෂයේ ගෙවීම් සඳහා අධිකාරි බලය ලත් නිලධාරියෙකුගේ සහතිකය ලබා නොගෙන අවස්ථා 04 කදී එකතුව රු.53,472 ක ගෙවීම් කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 237 (ආ) හා මුදල් රෙගුලාසි 751 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට සහතිකයක් හා භාණ්ඩ ලේඛන පොතේ සටහන් කළ බවට සාක්ෂි වවුචරය සමඟ ඉදිරිපත් නොකළ අවස්ථා 23 ක් නිරීක්ෂණය විය. |
| (iv) මුදල් රෙගුලාසි 245(i) හා මුදල් රෙගුලාසි 257 | අධිකාරියලත් නිලධාරියකු විසින් සහතික කළ ගෙවීම් වවුචර්වලට පමණක් ගෙවීම් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබූ අවස්ථා 10 නිරීක්ෂණය විය. තවද අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව විද්‍යාල 03 ක වවුචර් 26 කට අදාල සහතික නොකළ ගෙවීම් වවුචර් පැවතුණි. |
| (v) මුදල් රෙගුලාසි 232(2) | ගෙවීම් වවුචරයේ ගෙවන මුදල අකුරෙන් සඳහන් නොවූ අවස්ථා 14 ක් නිරීක්ෂණය විය. |
| (vi) මුදල් රෙගුලාසි 225(4) | යම් කිසි ගෙවීමක් හරි වැරදි බලන නිලධාරී විසින් හරි වැරදි බැලූ බවට වවුචරයේ කෙටි අත්සන් තැබිය යුතු වුවත් එසේ කර නොතිබුණු අවස්ථා 08 ක් නිරීක්ෂණය විය. |
| (vii) මුදල් රෙගුලාසි 206(i) | තැන්පතුවලින් ආපසු ගැනීමේ වවුචර් නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත් එසේ කර නොතිබූ අවස්ථා 05 ක් නිරීක්ෂණය විය. |
| (ඇ) <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u><br>නගර සභා ආඥා පනතේ 231(3) ඡේදය | ➢ ප්‍රධාන කාර්යාලයට අයත් ගොඩනැගිලි සඳහා නියමිත දිනට හෝ එදිනට පෙර වරිපනම් බදු නොගෙවීම හේතුවෙන් රු.898,157 ක වට්ටම් මුදලක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. |

- තාක්ෂණ/කාර්මික විද්‍යාල නියමිත දිනට පෙර වරිපනම් බදු නොගෙවීම නිසා රු.38,136 ක වට්ටම් මුදලක් රජයට අහිමි වී තිබුණි.

**3.7 විදේශාධාර ව්‍යාපෘති**

**ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය**

දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍ය ණය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් කාර්මික හා තාක්ෂණික විද්‍යාලවල ගොඩනැගිලි නවීකරණය කිරීම්, උපකරණ මිලදී ගැනීම් හා පුහුණු කිරීම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 462.68 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 329.97 ක් එනම් සියයට 71 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා නවීකරණය**

(i) 2015 වර්ෂයේදී නිම කිරීමට යෝජිතව තිබූ බණ්ඩාරවෙල, හෝමාගම හා සමන්තුරේ කාර්මික විද්‍යාල ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම් සඳහා රු.මිලියන 90.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එහෙත් සැලසුම් කළ පරිදි එම කටයුතු නිම කිරීම ප්‍රමාදවීම හේතුවෙන් රු.මිලියන 46.86 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 52 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම එම කටයුතු නිම කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද රු.මිලියන 40.00 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 35.83 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පොළොන්නරුව, නුවරඑළිය, වාරියපොළ හා කළුතර කාර්මික විද්‍යාලයන් 04 ක හා තාක්ෂණ විද්‍යාල 08 ක ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පිළිවෙලින් රු.මිලියන 120 ක් හා රු.මිලියන 155 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 86.33 ක් හා රු.මිලියන 84.78 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිමකිරීමට යෝජිතව තිබූ ප්‍රතිසංස්කරණ හා නවීකරණ කටයුතු නිම කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබෙන බව නිරීක්ෂණය විය.

(iii) මරදාන තාක්ෂණ විද්‍යාලයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සලසා තිබුණු රු.මිලියන 19.375 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ආ) උපකරණ මිලදී ගැනීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පොළොන්නරුව, නුවරඑළිය, වාරියපොල හා කළුතර කාර්මික විද්‍යාලවලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 80 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එමගින් රු.මිලියන 26.60 ක් වටිනා උපකරණ පමණක් මිලදීගෙන තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද කිසිම සැපයුම්කරුවකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල උපකරණ සපයා අවසන් කර නොතිබීම හේතුවෙන්

සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 53.40 ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) නුවරඑළිය කාර්මික විද්‍යාලයේ යන්ත්‍ර (Mechanist) පාඨමාලාව සඳහා රු.මිලියන 19.89 කට CNC Milling යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- එම යන්ත්‍රය ස්ථාන ගත කිරීමට නියමිතව තිබූ ගොඩනැගිල්ලෙහි අවශ්‍ය විදුලි සැපයුම් ධාරිතාවය ලබා ගැනීමට හා අවශ්‍ය පාදම සැකසීමට කල් ගතවූ බැවින් විශාල මුදලක් වැය කර මිලදී ගෙන තිබුණු මෙම යන්ත්‍රය 2017 නොවැම්බර් 30 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

- සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉහත දැක්වූ යන්ත්‍රයක අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණු අතර තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණ දැනුම හා කුසලතාවය ලබා දීම සඳහා මෙම යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර තිබුණි.

- මෙම යන්ත්‍රය අධිතාක්ෂණ නිෂ්පාදන යන්ත්‍රයක් බවද වර්තමානයේ නුවරඑළිය කාර්මික විද්‍යාලයේ මෙම පාඨමාලාව ඉගැන්වීම් කටයුතු සඳහා ස්ථිර උපදේශකවරයෙකු නොමැති බවද දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය සම්පත් හඳුනා ගැනීම හා ඒවා උචිතම කාර්මික/ තාක්ෂණ විද්‍යාලයට ලබාදීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදී මිලදී ගැනීම ආර්ථික නොවන ගනුදෙනුවක් බවට නිරීක්ෂණය විය.

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

දෙපාර්තමේන්තුවේ හා කාර්මික/ තාක්ෂණ විද්‍යාලවල ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ හා නවීකරණ කටයුතු පිළිබඳ සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ හදිසි ගොඩනැගිලි අලුත්වැඩියාව, වරකාපොල කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි අලුත්වැඩියාව, නව වහලයක් සවි කිරීම හා දඹුල්ල කාර්මික විද්‍යාලයේ කෘෂිකාර්මික විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම පිළිවලින් රු. 1,148,799 ක්, රු.3,370,002 ක්, රු. 4,116,510 ක් හා රු. 12,213,955 ක් විය. එම ඉදිකිරීම් සඳහා එක් කොන්ත්‍රාත් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. එම ආයතනය විසින් ඉදිරිපත් කර තිබුනු ලංසු වටිනාකම් ඉංජිනේරු ඇස්තමේන්තුවලට වඩා වැඩි වුවත් දෙපාර්ෂවයේ එකඟත්වය මත ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකමට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. කෙසේ වෙතත් අවසන් බිල්පත් බේරුම් කිරීමේදී ගිවිසුම්ගත වටිනාකමට වඩා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අමතර වැඩ වශයෙන් පිළිවෙලින් රු.440,623 ක්, රු.478,345 ක් හා රු.127,064 ක් ගෙවා තිබුණි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර නියමිත දිනයන්හිදී කොන්ත්‍රාත් අවසන් කිරීමටද අපොහොසත් වී තිබුණි.

(ආ) මන්නාරම කාර්මික විද්‍යාලයේ මායිම් වැට ඉදිකිරීම සඳහා රු.මිලියන 14.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ආරම්භ කර නොතිබුණි.

(ඇ) අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ නේවාසිකාගාරයේ හා දේශන ශාලාවල අතිරේක වැඩ ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එම කටයුතු සිදු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු.මිලියන 66 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**3.9 කාර්යසාධනය**

------------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**3.9.1 කාර්මික /තාක්ෂණ විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම හා පාඨමාලා පැවැත්වීම**

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්මික/ තාක්ෂණ විද්‍යාල 39 ක පාඨමාලා 69 ක් පැවැත්වීමටත් ඒ සඳහා සිසුන් 25,340 ක් බඳවා ගැනීමටත් සැලසුම් කර තිබුණි. ඒ අනුව 2015 සැප්තැම්බර් 04 හා 2015 නොවැම්බර් 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රවල සිංහල, දෙමළ, ඉංග්‍රීසි ජපන් හා කොරියන් භාෂා මාධ්‍යයන්ගෙන් පාඨමාලා 93 ක් සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 71 ක් සඳහා සිසුන් 26,591 ක් බඳවා ගෙන තිබුණි. මෙම බඳවා ගැනීම් පසුගිය වර්ෂයේ බඳවා ගත් සිසුන් 19,863 ක සංඛ්‍යාව හා සැසඳීමේදී සිසුන් 6,728 ක ප්‍රගතියක් ලබා තිබුණි. කෙසේ වෙතත් පසුගිය වර්ෂයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලා සීමිතව පැවැත්වීමටත් සිසුන් හැකිතාක් දුරට දැනේ කර්මාන්ත හා සම්බන්ධ වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීමටත් තීරණය කර තිබූ බැවින් පසුගිය වර්ෂයේ සිසුන් ඇතුළත්වීමේ ප්‍රවනතාවයේ අඩුවීමක් සිදුවී තිබුණි.

(ආ) බඳවා ගැනීමට සැලසුම් කරන ලද සිසුන් ගණන සත්‍ය බඳවා ගැනීම් සමග සැසඳීමේදී දෙපාර්තමේන්තුව ප්‍රගතියක් ලබා තිබුණද, මුළු පාඨමාලා සංඛ්‍යාවෙන් පාඨමාලා 11 කට අදාලව සිසුන් බඳවා ගැනීම, ඉලක්කගත සංඛ්‍යාවෙන් සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ඉංජිනේරු සැලසුම් ශිල්පය, මූලික හා වෘත්තීය ඉංග්‍රීසි පාඨමාලා, උසස් වෘත්තීය නිපුණතා ඇතුළු පාඨමාලා 15 ක් පවත්වා තිබුණි. ඒ සඳහා සිසුන් 6942 ක් එනම් බඳවාගත් කාර්මික විද්‍යාල සඳහා මුළු සිසුන් සංඛ්‍යාවෙන් සියයට 25 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ පැවැත් වූ පාඨමාලා අතරින් වැඩිම සිසුන් ගණනක් සහභාගී වූ පාඨමාලා ද ඒ අතර පැවතුණි.

(ඈ) සිසුන් 1,580 ක් බඳවා ගැනීම සඳහා සැලසුම් කරන ලද පාඨමාලා 13 වෙනුවෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම නිසා කිසිඳු තාක්ෂණ/ කාර්මික විද්‍යාලයක එම පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

(ඉ) ගැසට් පත්‍රයේ පලකරන ලද පාඨමාලා අතරින් පාඨමාලා 19 ක් පවත්වා නොතිබුණු අතර එසේ ගැසට් පත්‍රයේ පල නොකරන ලද පාඨමාලා 17 ක් පවත්වා තිබුණි.

### 3.9.2 පාඨමාලා ප්‍රතීතනය

----------------------

2013 පෙබරවාරි 26 දිනැති අංක 01/2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛය අනුව සියළුම පාඨමාලා ප්‍රතීතනය කළ යුතු වේ. එසේ වුවද, විගණිත දිනය වූ 2017 ජුනි 23 දිනට තාක්ෂණ/කාර්මික විද්‍යාල 39 හි පවත්වාගෙන යනු ලබන පාඨමාලා 771 කින් පාඨමාලා 82 ක් ප්‍රතීතනය කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රතීතනය නොකරන ලද පාඨමාලා හදාරණ සිසුන්ට පාඨමාලාව අවසන් කර විද්‍යාලයෙන් ඉවත්ව යන විටත් ජාතික මට්ටමේ සහතිකයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී යාමට ඉඩ ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

### 3.9.3 සිසුන් පාඨමාලා හැරයාම

----------------------------

විගණනයට ලබා දී තිබුණු තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ සිසුන් 26,591 කින් සිසුන් 7,495 ක් හෙවත් සියයට 28 ක් පාඨමාලා හැරගොස් තිබුණු බවට නිරීක්ෂණය විය. මෙම සංඛ්‍යාවෙන් පාඨමාලා 08 ක සිසුන් හැරයාමේ ප්‍රතිශතය ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 50 ටත් වඩා වැඩි විය.

### 3.9.4 විභාග ප්‍රතිඵල

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විභාග අංශය විසින් ඉදිරිපත් කරන ලද විභාග ප්‍රතිඵල පිළිබඳ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ පැවති විභාග සඳහා සිසුන් 18,895 ක් පෙනී සිටි අතර ඉන් 10,327 ක් සමත් වී තිබුණි. ඒ අනුව සිසුන් 8,568 ක් එනම් සියයට 45 ක් අසමත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාගවලින් පහත සඳහන් පාඨමාලාවල 2017 නොවැම්බර් 30 දින දක්වාම ප්‍රතිඵල නිකුත් කිරීමට දෙපාර්තමේන්තුවේ විභාග අංශය අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් සිසුන්ට ඔවුන්ගේ ඉදිරි කටයුතු කරගෙන යාමේ ගැටළු පැන නැගී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විද්‍යාලයේ නම | පාඨමාලාවේ නම | නිකුත් නොකළ ප්‍රතිපල |
|---|---|---|
| මඩකලපුව | NCT සිවිල් ඉංජිනේරු | පළමු සමාසිකය |
| බදුල්ල, කුරුණෑගල, හෝමගම, මඩකලපුව, සමන්තුරේ | NCT සිවිල් ඉංජිනේරු | තෙවන සමාසිකය |
| මහනුවර, සමන්තුරේ | විදුලි ඉංජිනේරු | දෙවැනි සමාසිකය |
| සමන්තුරේ | විදුලි ඉංජිනේරු | තෙවන සමාසිකය |
| කුරුණෑගල, ඇඹිලිපිටිය | ප්‍රමාණ සමීක්ෂණ | පළමු සමාසිකය |
| හෝමගම, ගම්පහ, කළුතර, මහනුවර, මඩකලපුව, අනුරාධපුර, ඇඹිලිපිටිය, වරකාපොල,වව්නියාව | ප්‍රමාණ සමීක්ෂණ | දෙවන සමාසිකය |
| මරදාන, හෝමගම, ගම්පහ, යාපනය, සමන්තුරේ, ඇඹිලිපිටිය සහ මහනුවර | ප්‍රමාණ සමීක්ෂණ | තෙවන සමාසිකය |

(ඇ) සිවිල්, විදුලි හා කාර්මික ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ, ඉදිකිරීම්, විදුලි සංදේශ, මෝටර් රථ තාක්ෂණය හා ජාතික සහතික පත්‍ර පාඨමාලාවල සමාසික හා අවසාන විභාග සඳහා පෙනී සිටි

සිසුන් 1,865 දෙනෙකුගෙන් කිසිවෙකු එම විභාගවලින් සමත් වී නොතිබුණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාග පැවැත්වීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඈ) සිසුන් 101 දෙනෙකු පෙනී සිටින ලද පාඨමාලා 09 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවා තිබුණි.

ඉහත තොරතුරුවලට අනුව දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සිසුන් සමත්වීමේ ප්‍රවනතාවය දුර්වල මට්ටමක පැවතුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.10 මානව සම්පත් කළමණාකරණය

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1313 | 612 | 702 | 01 |
| (ii) | තෘතීය මට්ටම | 144 | 39 | 105 | - |
| (iii) | ද්විතීය මට්ටම | 1272 | 844 | 430 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1167 | 944 | 245 | 22 |
| | **එකතුව** | **3896** | **2439** | **1482** | **25** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ අධ්‍යක්ෂවරු 05 දෙනාගෙන් 04 දෙනෙක් ද තාක්ෂණ විද්‍යාල 09 හි අධ්‍යක්ෂවරු හා අතිරේක අධ්‍යක්ෂවරු 18 දෙනාගෙන් 12 ක් ද කාර්මික විද්‍යාලවල විදුහල්පතිවරු 30 දෙනාගෙන් 23 දෙනෙකුද උප විදුහල්පතිවරු 30 දෙනාම ද පුරප්පාඩුව පැවතුණි. තාක්ෂණ/කාර්මික විද්‍යාලවල කතිකාචාර්යවරු 214 දෙනෙක්ද උපදේශකවරු 274 දෙනෙක්ද වෘත්තීය උපදේශන නිලධාරීන් 22 ක් ද නීති නිලධාරිද, රෙජිස්ට්‍රාර්වරු 39 දෙනාගෙන් 20 දෙනෙකුද එම පුරප්පාඩු අතර විය.

(ආ) අතිරික්ත සේවක සංඛ්‍යාව 25 ක් වූ අතර ඉන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර හිමි නිලධාරිනිය 2015 ජනවාරි 05 දින සිට වසර 05ක කාලයකට විදේශගත වීම හේතුවෙන් එම තනතුරට වෙනත් නිලධාරිනියක් පත් කර තිබුණු අතර අතිරික්ත කාර්ය මණ්ඩලයේ 24 දෙනෙකු අනුමත නොවූ තනතුරුවලට පත් කර තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතුණු අතර එම තනතුරුවල වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර තිබුණ ද ඒ සඳහා ස්ථිර පත්වීම් ලබා දීම ප්‍රමාද වී පැවතුණි. පරිපාලන නිලධාරී තනතුර සඳහා ස්ථිර පත්වීමක් ලබා දීමට කටයුතු කර නොතිබුනු අතර වෙනත් දෙපාර්තමේන්තුවක නිලධාරියෙකු ඒ සඳහා වැඩ බැලීමට පත් කර තිබුණි. කාර්මික නිලධාරී තනතුර සඳහා ස්ථිර පත්වීමක් ලබා දීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු පත් කර තිබුණි.

(ඈ) කාර්මික හා තාක්ෂණික විද්‍යාලවල බාහිර උපදේශකවරුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 305.92 ක් බාහිර උපදේශක දීමනා වශයෙන් ගෙවා තිබුණි. එම දේශකවරුන් බඳවා

ගැනීම විද්‍යාල පදනමින් සිදුවන අතර ඔවුන් දේශන පැවැත්වීමේදී පවතින කාර්යක්ෂම බව හා ඵලදායීතාවය පිළිබඳ ඇගයීමක් ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රමාණවත් පරිදි සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සමහර විද්‍යාලවල බඳවාගෙන තිබූ බාහිර දේශකයින්ගේ සුදුසුකම්වලට අදාල සහතික පත්වල පිටපත් සත්‍ය බවට තහවුරු කරගෙනද නොතිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ තුන්වන පරිච්ඡේදයේ 3.8.2. වගන්තිය හා දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව ඒ ඒ ගණයට අයත් කාර්ය ස්ථානයක සේවය කළ යුතු උපරිම කාලපරිච්ඡේදය අනුව ස්ථාන මාරු ලබා දිය යුතුය. කෙසේ වුවද අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වසර 10 ක සේවා කාලයක් ඉක්මවූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 29 දෙනෙකු හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ 42 දෙනෙකුද විය.

ඉහත සඳහන් කාර්ය මණ්ඩලය තුළ කාර්මික විද්‍යාල 09 ක එකම සේවා ස්ථානයේ වසර 20 ඉක්මවූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 14 ක් විය.